**The sermon of Our Blessed Saviour on the Mount / extracted from the New Testament, and circulated by the Colombo Auxiliary Bible Society.**

**Contributors**

Jesus Christ.
Colombo Auxiliary Bible Society.

**Publication/Creation**

Colombo : Wesleyan Mission Press for Auxiliary Bible Society, 1816.

**Persistent URL**

https://wellcomecollection.org/works/r8qubmb8

**License and attribution**

This work has been identified as being free of known restrictions under copyright law, including all related and neighbouring rights and is being made available under the Creative Commons, Public Domain Mark.

You can copy, modify, distribute and perform the work, even for commercial purposes, without asking permission.

Wellcome Collection
183 Euston Road
London NW1 2BE UK
T +44 (0)20 7611 8722
E library@wellcomecollection.org
https://wellcomecollection.org

# THE SERMON

OF

# OUR BLESSED SAVIOUR,

## ON THE MOUNT;

Extracted from

## THE NEW TESTAMENT,

AND

*CIRCULATED*

BY THE COLOMBO AUXILIARY BIBLE SOCIETY.

---

අපගේ ස්වාමිවූ

ගැලවුම්කාරයානන්වහන්සේ

පර්වතයෙහි වැඩහිඳ කලාවූ

දෙසනාවය.

---

*COLOMBO:*

PRINTED FOR THE COLOMBO AUXILIARY BIBLE SOCIETY,

*At the Wesleyan Mission-Press.*

1816.

WELLCOME
HISTORICAL
MEDICAL
LIBRARY

# සුඬවූ මතෙවූ විසින් ලියනලද මඟල වෘත්තාන්තයේ.

𑇥 වෙනි. 𑇦 වෙනි. 𑇧 වෙනි පරිච්ඡෙද වල්හි ලියවී තිබෙන ලෙස පූනාංවනතාවූ අපගෙ ගැලවූන් කාරයානවහන්සේ පර්වතායපිටදී කලාවූ දේසනාව ගැනය.

## 𑇥 වෙනි පරිච්ඡෙදය.

පූනාංවනතායන් ප්‍රකාසකරමින් පර්වතාය පිටදී ක්‍රිස්තුස්වහන්සේ පටන්ගතතාවූ දෙසනාවය.

𑇡 වෙනි 𑇭𑇨 වෙනී පදවිල්ය.

යේසූස්වහන්සේ ජනසමූහයාදැක පර්වතායට නැගුණූසේක එහි වැඩඋන්කල්හි උන්වහන් සේගේ සිස්‍යයෝ තමන්වහන්සේකරා එලඹූ

ණාහුය එවිට උන්වහන්සේ තමන්වහන්සේ
ගේ මුඛය විවෘතකොට ඔවුන්ට උගන්වමින්
වදාරනසේක් සිතින් උඩඟු නැත්තෝ පුණ්‍ය
වන්තයෝය මක්නිසාද ස්වර්ගරාජ්‍යය ඔවුන්
ගේය ශෝකවෙන්නෝ පුණ්‍යවන්තයෝය මක්
නිසාද ඔවුන් අස්වැසිලි ලබත මෘදුගුණ ඇ
ත්තෝ පුණ්‍යවන්තයෝය මක්නිසාද පෘථිවිය
ඔවුන්ට දායාදකොට දෙනුලැබේ ධර්මිෂ්ට
කමට සාපිපාසඇත්තෝ පුණ්‍යවන්තයෝය මක්
නිසාද ඔවුන් තෘප්තියට පැමිණෙත කරුණා
ඇත්තෝ පුණ්‍යවන්තයෝය මක්නිසාද ඔවුන්
කරුණාව ලබත පවිත්‍රසිත් ඇත්තෝ පුණ්‍යව
න්තයෝය මක්නිසාද ඔවුන් කරුණාවලබත
පවිත්‍ර සිත්ඇත්තෝ පුණ්‍යවන්තයෝය මක්නි
සාද ඔවුන් දෙවියන්වහන්සේ දකිත සමගි
කරන්නෝ පුණ්‍යවන්තයෝය මක්නිසාද ඔව
න් දෙවියන්වහන්සේගේ පුත්‍රයෝයයි කියනු
ලැබෙති ධර්මිෂ්ටකමනිසා පෙළනු ලබන්නෝ,
පුණ්‍යවන්තයෝය මක්නිසාද ස්වර්ගරාජ්‍යය

ඔවුන්ගේය මනුෂ්‍යයෝ මානිසා තොපට නින්දද පීඩාදකොට තොපට විරුද්ධව සියළු අසාර අගුන බොරුවෙන් කියද්දී තොපි පූන්‍ය වනාහයෝය එවිට තොපි සතුටුව ඉතා ප්‍රීතිවෙසව් මක්නිසාද තොපට ස්වර්ගයෙහිදී මහත් විපාකවනෙනා්ය කුමක්හෙයින්ද තොපට ප්‍රථම විසූ අනාගතවක්තෘන්ටත් එසේ පීඩාකලාහුය.

ක්‍රිස්තුස්වහන්සේ තමන්ගේ සිෂ්‍යයන්ට පොලොවෙහි ලුනුද ලොකයෙහි ආලොකයද පර්වතයක් මුදුනෙහි තිබෙන නුවරෙහිද පහන්කනෙද ප්‍රකාරයකින තමනවහන්සේ විසින් ඔවුන්කෙරෙයි ප්‍රකාසකරන්ට කැමති වනලද සූභ ආදිසය ගැනය.

ඍං වෙනි ඍව වෙනි පදවිල්ය.

තොපි පොලොවෙහි ලුනුය එහෙත් ඒ ලුනෙහි රසනැතිවිනම් එවිට කිමෙකින් ලුනුදමනු ලැ

බේද එයින්පසු ඒවා පිටතවලීමටද මනුෂ්‍ය
යන්ගේ පයින් මර්දනකරනුලබන්ටද මිස අ
න්කිසිවකට නොවටිනේය තොපි ලොකයෙහි
ආලෝකයවනනාහුය පර්වතයක්මුදුනෙහි ති
බෙනනුවරක් වලගන්ට නොහැකිවනේය
මනුෂ්‍යයෝ පහනක්දල්වා ධාන්‍යමනීන මිමම
ක්යට නොතිබත එහෙන් පහන්කන්දක් උඩ
තබත එවිට ගෙයිවසන සියල්ලන්ටම ආලෝ
ක කරනේනාය මනුෂ්‍යයෝ තොපගේ යහපත්
ක්‍රියාවල් දැක ස්වර්ගයෙහි වැඩසිටින තොපගේ
පියානවහන්සේට ප්‍රසංසාකරණපිනිස තො
පගේ ආලෝකය ඔවුන් අභිමුඛමයෙහි දීප්ති
වේවා.

## ක්‍රිස්තුස්වහන්සේ ආගමසම්පූර්ණ
## කිරීමට විනා ඒකවිනාස
## කිරීමට නොආවාවූකාර
## නාව ගැනය.

## ෂෂ්ඨ වෙනි සී වෙනි පදවල්ය.

ආගම් හෝ අනාගතවක්තෘන් හෝ නැත්කිරීමට මම නොආයෙමියි නොපි නොසිතව් සම්පූර්ණකෙරීමට මිස නැතිකෙරීමට මම නොආයෙම් සැබවක් නොපට මම කියම් අහසත් පොලොවත් නැතිවෙනතුරු ආගමෙන් එක අක්ෂරයකුදු එක්බින්දුමත්‍රයකුදු සියල්ලම සම්පූර්ණවෙනතෙක් කොයි ප්‍රකාරයකිනවත් නැතිනොවනේය එබැවින් මේ ඉතා කුඩාවූ ආඥාවන් අතරෙන් එක කුදු කඩකරනනාවූ මනුෂ්‍යයන්ටත් එසේ කරන්ට උගන්වනනාවූ යමෙක් ඇද්ද හෙතෙම ස්වර්ගරාජ්‍යයෙහිදී ක්ෂුද්‍රතරයහයි කියනුලැබේ එහෙත් ඒ ආඥාවන් පවත්වනනාවූ උගන්වනනාවූ යමෙක් ඇද්ද හෙතෙම ස්වර්ග රාජ්‍යයෙහිදී උත්තමයහයි කියනුලැබේ මක්නිසාද නොපට මම කියම් නොපගේ ධර්මිෂ්ටකම ආධ්‍යායකයන්ගේ සහ ඵරිසීවරුන්ගේද ධර්මිෂ්ටකම වැඩි නොවීනම් කොයිප්‍රකාරයකිනුවත් නොපි ස්වර්ග රාජ්‍යයට ප්‍රවිෂ්ට නොවනනාහුය.

ක්‍රිස්තුස්වහන්සේවිසින් ප්‍රාණඝාතයට විරුද්ධව
තාප්පීනය කරණලද ආඥාවගැනය.
සීශ වෙනි සිට වෙනිපදවල්ය.

ප්‍රාණඝාතය නොකරව ප්‍රාණඝාතයකරණ කවරෙක් නුමුත් විනිශ්චයෙහි දඬුවමට සුදුසුවන්නේයයි පුරාතනයන්ට කීබව තොපි විසින් අසනලද්දේය එහෙත් තොපට මම කීයම් තමාගේ සහෝදරයාට නිෂ්කාරණයෙහි කෝපවෙනානාවූ කවරෙක්නුමුත් විනිශ්චයෙහි දඬුවමට සුදුසුවන්නේය තමාගේ සහෝදරයාට රාකාතියනානාවූ කවරෙක්නුමුත් අධිකාරණසභාවෙහි දඬුවමට සුදුසුවන්නේය තෝ අඥානයයි කියනානාවූ කවරෙක්නුමුත් නරකාග්නියෙහි දඬුවමට සුදුසුවන්නේය එබැවින් තාගේ පඬුරපූජාසනයට ගෙනාකල්හි තාගේ සහෝදරයා තාකෙරෙහි යම්විරුද්ධයක් ඇතිබව එහිදී සිහිවීනම් තාගේ පඬුර එහිපූජාසනය අභිමුඛයෙහි තබාගොස් පළමුකොට තාගේ සහෝදරයා සමගිව අවුත් තාගේ පඬුරපූජාකරව තාගේවිරුද්ධකාරයා සමග මාර්ගයෙහි

ඉක්මින්ම වහාම ඔහුහා සමගිවෙව එසේ නො කලොත් යම්විටක තාගේ විරුඬකාරතෙම හා අධිකරණ නායකයාහට පාවාදෙනෙන්ය ඔහුවිසින් තෝ සෙවකයහට බාරදෙනලදුව දඩගෙහි දම්නුලබනෙනාහිය සැබවක් තට මම කියම් අන්තිමසල්ලිය ගෙවනතුරු කොයි ප්‍රකාරයකින්වත් තෝ එයින් නොනික් මෙ නෙනාහිය.

පරදාරකර්මය ගැනයි.

සීවු වෙනි ම්ල වෙනිපදවල්ය:

පරදාරකර්මය නොකරවයි පුරාතනයන්ට කීබව තොපවිසින් අසනලද්දේය එහෙත් තො පට මමකියම් යම් කිසිවෙක් කාමචෙතනාවෙන් ස්ත්‍රියක් බලාද හෙතෙම එතෙනෙහිම සවකීය සිතින් ඈහාසමග පරදාරකර්මය කෙළේය තාගේ දකුනැස තට බාධාකෙරේනම් ඒක උපුටා තාගෙන් ඉවත දමව මක්නිසාද තා ගේ සකල ශරීරය නරකයෙහි හෙලනු ලබන වාට වඩා තාගේ අවයවවලින් එකක් නැති වීම තට ඉතායහපත තාගේ දකුණතට බාධා

කෙරේනම් ඒකනාගෙන් සිඳහරුව මත්නි
සාද තාගේ ශකල ශරීරය නරකයෙහි හෙලනු
ලබනවාට වඩා තාගේ අවයවයන් අතුරෙන්
එකක් නැතිවීමතට්යහපත යමෙක් තමාගේ
භාය්‍ය්‍යාවහරින්නේනම් හෙතෙම ඇට අත්හැ
රීම්පත්‍රයක් දෙවයි කියනලද්දේය එහෙත්
තොපට මම කියමි වෛශ්‍යකාමකට මිස තමා
ගේ භාය්‍ය්‍යාවහරිනනාවූ යමෙක් ඇද්ද හෙතෙම
ඇලවා කාමමිථ්‍යාචාරය කරවන්නේය යමෙක්
වනාහි හරිනලද ස්ත්‍රිය විවාහකරගන්නේ
නම් හෙතෙම පරදාරකර්මය කරන්නේය.

බොරුදිවිරීම් ගැනය.

ම්ස වෙනි ම්වූ වෙනිපදවල්ය.

නැවතද බොරුදිවුරුන් නොකරව එහෙ
ත් ස්වාමීන්වහන්සේ අභිමුඛයෙහි කරණලද
තාගේ දිවුරුන් දිවුරුපරිද්දෙන් කරවයි පූරා
තනයන්ට කිබව තොප විසින් අසනලද්දේය
එහෙත් තොපට මම කියමි කිසිදිවුරුමක්

නොදිව්රව් දෙවියන්වහන්සේගේ සිංහාසනය බැවින් අහසගැනවත් උන්වහන්සේගේ පාද පීඨය බැවින් පොළොවගැනවත් අග්‍රරජහුගේ නගරය බැවින් යෙරුසලමගැනවත් එක් ඉසකෙසක් සුදුකරන්ටවත් කළුකරන්ටවත් නොහැකි බැවින් ඉසගැනවත් නොදිව්රව එහෙත් තාගේ වචනය එසේය එසේය කියාද නැත නැතැයි කියාද වේවා මක්නිසාද මෙ යට වැඩිවූ යමක්ඇද්ද ඒකනපුරෙන් හටගන් නේය.

ඉවසිල්ලෙන් වැරදි උදුලනපිණිස
ක්‍රිස්තුස්වහන්සේ දනුමැති
කන්දුන් කාරනාව ගැනය.
මතූ වෙනි කෘලෙ වෙනි පදවල්ය.

ඇසට ඇස දතට දත යනාකිම තොපවිසින් අසනලද්දේය එහෙත් තොපට මම කියමි හිං සාව නොවලක්වව් යමෙක් වනාහි තාගේ

දකුණු කපොලයට ගැසීනම් අනික් කපෝල යද ඔහට පෙරලාදෙව යමෙක් තාගේ අණ කරවාසකය ගනාපිනිස අධිකරණ සථාන යෙහි යුකති කියනු කැමතිවීනම් ඔහට උතු රු සළුවත් හත්වදෙව යමෙක් ගොවක් යන්ට තාට බලාත්කාර කොලේනම් ඔහුහා සමග දෙගව්වක් යව තාගෙන් ඉල්ලනනා හට දෙව තාගෙන් ණයට ගනාට කැමැතතා හට පරාඞ්මුඛ නොවව.

### අපගේ සතුරන්කෙරෙහි සෙනෙහ වීම ගැනය.

### [illegible] වෙනි [illegible] වෙනි පදවල්ය.

තමාගේ අසල්වාසියහට සෙනෙහසරව තමා ගේ සතුරාට වෛර කරවයි කිබව තොපවිසින් අසනලද්දේය එහෙත් තොපට මම කියමි ස්වර්ගයෙහි වැඩසිටින තොපගේ පියානන් වහන්සේගේ පුත්‍රයෝ වෙනපිනිස තොපගේ සතුරන්ට ප්‍රේමකරව් තොපට අවනනාවුන්ට ආශීර්වාද කරව් තොපට වෛර කරනනාවුන්ට යහපත්කම් කරව් තොපට නිග්‍රහකරණනා

වූන් සහ පීඩාකරන්නාවූන් වෙනුවෙද යාඥා වෙයව් මක්නිසාද යහපතුන්ටත් අයහපතුන්ටත් උන්වහන්සේ තමන්වහන්සේගේ සූර්ය උදාකරවනසේක සත්පුර්ෂයන්ටත් අසත්පුර්ෂයන්ටත් වැසිවස්වනසේක ඉදින් තොපට ප්‍රෙමකරන්නාවූන්ට තොපිත් ප්‍රෙමකරව්නම් තොපට කවර ප්‍රයොජනයෙක් වේද සුංගන් අයකරන්නෝ පවා එසේ නොකෙරෙද්ද ඉදින් තොපගේ සහොදරයන්ට පමනක් නමස්කාර කරව්නම් අන්‍යයන්ටවඩා තොපි තුමක් කරව්ද සුංගම් අයකරන්නෝ පවා එසේ නොකෙරෙද්ද.

නිර්මලකම පිනිස උත්සාහය
ගැනය.
[illegible] වෙනි පදය.

ස්වර්ගයෙහි වැඩසිටින තොපගේ පියානන් වහන්සේ යම්සේ නිර්මලව සිටිනසේක්ද තොපිදු එසේම නිර්මලවව්.

## ක්‍රිස්තුස්වහන්සේ දේශනාව පවත්වමින් දානයදීම සඳහා වදාල ආඥාව ගැනය.

### ෧ මුවෙනි ෪ වෙනි පදවල්ය

මනුෂ්‍යයන්ට පෙනෙන පරිද්දෙන් ඔවු නොවුන්ගේ අභිමුඛයෙහි තොපගේ දානය නොදෙන්ට ප්‍රවේසම් වෙයව් ඉදින් එසේ දුනහොත් නම් ස්වර්ගයෙහි වසන තොපගේ පියානන්වහන්සේගෙන් තොපට ඵලයක් නැතොත්ය එබැවින් කපටයෝ මනුෂ්‍යයන්ගෙන් ප්‍රසංසා ලබන පිනිස සිනාගොගවල සහ වීථි වලදීත් කරන්නාක්මෙන් තෝ දානය දෙනකල තා අභිමුඛයෙහි බෙරනොගසව සැබවක් තොපට මම කියම් ඔවුන්ගේ ඵල ඔවුන්ටම ලැබුනෝය තෝ වනායි දන් දෙනකල තාගේ දානය රහස්ව තිබෙනපිනිස තාගේ දකුනත කරනදේ තාගේ වමත නොදනීවා එවිට රහසින් දක්නාවූ තාගේ පියානන්වහන්සේ තට විපාක ප්‍රසිද්ධලෙස දෙනසේක.

## යාඥාවීම ගැනය
## 𑇥 වෙනි 𑇦 වෙනිපදවල්ය

තෝ යාඥා කරනකල්හී කපටියන්මෙන් නො
වෙව මක්නිසාද මනුෂ්‍යයන්ට පෙනෙනා
පිනිස සිනගොගවලද මාර්ග සන්ධිවලද සිට
යාඥාවෙන්ට කැමතිවනාහුය සැබවක්
තොපට මම කියමි ඔවුන්ගේ ඵල ඔවුන්ටම
ලැබුණෝය තෝ වනාහී යාඥාකරනකල තා
ගේ ඇතුල්ගෙට වැද දොරවසා රහසිගතව
වසන තාගේ පියානන්වහන්සේට යාඥා
කරව එකල රහසින් දක්නාවූ තාගේ පියා
නන්වහන්සේ ප්‍රසිද්ධයෙන් තට විපාක දෙන
සේක එහෙත් තොපි යාඥා වෙනකල අන්‍ය
දෘෂ්ටිකයන්මෙන් නිරාර්ථක බස් නොකියව්
මක්නිසාද තමන්ගේ බොහෝකීම කරන
කොටගෙන අසනු ලබනාහුයයි සිතති
එහෙත් ඔවුන්ට සමාන නොවව් මක්නිසාද
තොපගේ පියානන්වහන්සේ තොපට ප්‍රයෝ

ජන සිමේක්දැයි නොපි උඹවහන්සේට යාඥා කරන්ට පළමුවෙන් දනගාසේක එහෙයින් නොපි මෙසේ යාඥාකරව් කෙසේදයත් ස්වර්ගයෙහි වැඩසිටින අපගේ පියාණන්වහන්ස ඔබවහන්සේගේ නාමය ශුද්ධවේවා ඔබවහන්සේගේ රාජ්‍යය ඒවා ඔබවහන්සේගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් භූමියෙහිද කරනු ලැබේවා අපේ දවස්පතා භෝජනය අපට අද දී වදාළමැනව අපේ නයකාරයින්ට අපි ක්ෂමා වෙනාක්මෙන් අපේ නයත් අපට ක්ෂමා වී වදාළමැනව අපි පරීක්ෂාවීමට නොපමුනුවා නපුරෙන් අපගලවා වදාළමැනව මක්නිසාද රාජ්‍යයත් පරාක්‍රමයත් මහිමතාවත් සදාකල්හිම ඔබවහන්සේගේමය. ආමෙන්.

අපගේ සහෝදරයින්ට

ක්ෂමාවීම ගැනය.

[illegible] වෙනි [illegible] වෙනිපදවල්ය.

මන්නිසාද මනුෂ්‍යයන්ගේ වරදවල් තොපි ක්ෂමාවච්නම් තොපගේ ස්වර්ගීයවූ පියානන්වහන්සේ තොපටත් ක්ෂමාවනාසේක එහෙත් තොපි මනුෂ්‍යයන්ට ඔවුනොවුන්ගේ වරද ක්ෂමා නොවච්නම් තොපගේ පියානන්වහන්සේත් තොපගේ වරද ක්ෂමා නොවනාසේක.

## උපවාසය ගැනය.

## 𑇪𑇦 වෙනි 𑇪𑇨 වෙනිපදවල්ය.

සලිත් තොපි උපවාසයකරණකාල කපටයන් මෙන් කලානතාවූ මුහුනු ඇති නොවච් මන්නිසාද ඔවුන් උපවාසය කරනාවුන් මනුෂ්‍යයන්ට පෙනෙනා පිනිස තමන්ගේ මුහුනු විවර්ණ කරනාහුය සැබැවක් තොපට මම කියමි ඔවුන්ගේ විපාක ඔවුන්ට ලැබුනෝය තොපි වනාහි උපවාසය කරණකාල රහසිගතව වසනා තාගේ පියාන්නවහන්සේ හැර මනුෂ්‍යයන්ට තෝ උපවාසකරනබව නොපෙනෙනා පිනිස තාගේ හිස තෙලින් ආලෙපකොට මුඛශෝධාවනායකරව එවිට රහසින්දක්නාවූ තා

ගේ පියාණන්වහන්සේ ප්‍රසිද්ධලෙස තට විපාක
දෙනසේක.

## ස්වර්ගයෙහි වස්තුරැස්කරගැනීම
## පිණිසය.
### ෂ්ණ් වෙනි ඝ්‍ර වෙනිපදවල්ය.

භූමියෙහි තමන්ට වස්තුරැස්කර නොග
න්නීවී එහිදී කාවෝද මලකඩද ඒවාවිනාසකරන්
නාහූය එහිදී සොරුළුමන් කැන සොරකන්
කරනාහූය එහෙත් ස්වර්ගයෙහි තමන්ට
වස්තුරැස්කරගනිව් එහිදී කාවන්විසින්ද මල
කඩවලින්ද ඒවා නැසෙන නොලබති එහිදී
සොරු උමන් කැන සොරකම්නොකරති ම
න්නිසාද තොපගේ වස්තුයම් තැනෙක්හිද
තොපගේ චිත්තයත් එහිමය.

## තනිවූ අක්ෂියක් ආරක්ෂාකෙරීම ගැනය.
### ඞ්ශ වෙනි ඞ්ශ වෙනිපදවල්ය.

ඇස ශරීරයට ප්‍රදීපයෙක එහෙයින් තා

ගේ ඇසයහපත්ව තිබේනම් තාගේ සකල ශරී
රය දීප්තිමත්වෙනෝය ඉදින් තාගෙ ඇස
යහපත්ව තිබේනම් තාගේ සකල ශරීරය
අන්ධකාරවෙනෝය එබැවින් ඇතුලත තිබෙ
න ආලොකය අඳුරුවිනම් ඒ අන්ධකාරය කොම
කොපමන මහත්වේද.

## ලොකවාසිවූ දේවල්වලට නලඟු නොව එහෙත් ප්‍රධාන කොට දෙවියන්වහන්සේගෙ රාජ්‍ය යද උන්වහන්සේගේ ධාර්මිකත්ව යද සෙවීමට ක්‍රිස්තුස්වහන්සේ දුන් දැනුමැතිකම ගැනය.

### ඊණු වෙනි මීණු වෙනිපදවල්ය.

ස්වාමීහු දෙදෙනෙක් සේවයකිරීමට කව
රෙකුදු නොහැකිවෙනෝය මක්නිසාද එකෙ

සුව අප්‍රියව ඉතර්යහට ප්‍රියවෙනෙන්ය හෙවත්
එකසැට ඇළුම්ව ඉතරයහට නින්දකරනෙන්ය
තොපි වනාහි දෙවියන්වහන්සේටද ධනය
ටද සෙවණකරන්ට නොහැකිවන්නාහුය එහෙ
යින් තොපට මම කියම් කුමක් කමුද කුමක්
බොමුද තමන් ජීවත්විම පිනිසද කුමක් අඳි
මොදැයි තමන් ශරීරය පිනිසද සිතිවිලිනො
සිතව් භොජනයට වඩා ජීවිතයද ඇඳීමට වඩා
ශරීරයද අධිකතර නොවේද ආකාසචාරී ප
ක්ෂීන් බලව් ඔවුන් වපුරනාහුද නොවෙති
කපනාහුද නොවෙති අටුවෙහි රැසකරන්
නාහුද නොවෙති එතකුදු උවත් තොපගෙ
ස්වර්ගීයවූ පියානන්වහන්සේ ඔවුන් පොෂ්‍යකර
ණසේක කිමෙක්ද තොපි ඔවුන්ට වඩා උතු
ම් නැතනාහුද සිතිවිලි සිතීමෙන් තමාගෙ
උසට වඩා එකරියනකුදු වැඩිකරගන්ට තො
ප අතරෙන් කවරෙක් පොහොසත් වේද
තොපි වස්ත්‍රගැන කුමක් පිනිස සිතිවල කර
වුද කෙතෙහි කසපාරි පුස්පයෝ වැයම් නො
මක්රෙති හූල්ද නොකටිති එහෙත් තොපට

මම කියම් තමාගේ ඩියඩු ඉසුරෙන් සූතාවූ සලමොණ් පවා එයින් එකක්ලෙස අලන් කාර නුවූයේය එහෙයින් අද තිබී සෙට උදු නෙහි දමනු ලබනනාවූ කොතොහි තීනා දෙවි යන්වහන්සේ මෙසේ සජහනා යේක්නම් එඩා අල්ප සඩා ඇතෙතානී උන්වහන්සේ තොප වැඩිතරව නොසර්ජනසේත්ද එසේ හෙයින් කුමක් අනුබවකරමෝද කුමක් පානය කරමෝද කුමක් අඳිමෝදැයි සිතිවිලි නොසිතාව් මක්නිසාද මෙසියල්ල අනාය දීන් වියෝ සොයනනාහුය එහෙත් මේ සියල්ලම තොපට ප්‍රයෝජනඇතැයි තොපගේ ස්වර්ගීවූ පියානන්වහන්සේ දනනාසේක එහෙත් තොප පළමුවෙන් දෙවියන්වහන්සේගේ රාජ්‍යයද උන්වහන්සේගේ ධාර්මිකකමයද සොයව් එවිට මේසියල්ල තොපට දෙනු ලැබේ එබැවින් සෙටදවස නිසා සිතිවිලි නොසිතාව් මක්නිසාද සෙටදවස තමාගැනම

සිතහොත්ය දිනයාගේ ද්වේසය ඒ දවසට පමණි.

## හත්වෙනි පරිච්ඡේදය.

### චපල විනිශ්චය දඬුවමට පමුණුවනලද කාරුණු උදෙසා ක්‍රිස්තුස්වහන්සේගේ දේසනාවේහි පටත්ගත් කාරනය ගැනය.

### ෧ මුවෙනි ෨ වෙනි පදවල්ය.

තොපි විනිස්චයකරනු නොලබනු පිනිස විනිස්චය නොකරව් මක්නිසාද යම් විනිස් චයකින් තොපි විනිස්චයකරව්නාම් එයින්ම විනිස්චයකරනු ලබනනාහුය යළිත් යම් මානයකින් මනිව්නාම් එයින්ම නැවතා තොපට මනිනු ලැබේ සිය ඇස තිබෙන ගෝනැස සඳහම්නොකොට තාගේ සහෝදර යාගේ ඇසෙහි තිබෙන ලවය කුමක් පිනිස

බිලනෙහිද නොහොත් බලව ස්ය ඇස ගෝනැස තිබියදී තා ඇස තිබෙන ලවය පහ කරෙමියි තාගේ සහෝදරයාට කෙසේ කියනෙහිද එඹා කපටය පලමුකොට තා ඇස තිබෙන ගෝනැස පහකරව එවිට තාගේ සහෝදරයාගේ ඇසතිබෙන ලවය පහ කරන්ට මනාකොට දත්නෙහිය.

### පිරිසිදුදේවල් අශුඩ නොකරන්ට ක්‍රිස්තුස්වහන්සේ ආජ්ඥාය කලාවූ කාරනාව ගැනය.

### ව වෙනි පදය.

පිරිසිදුවූදේ සුනඛයන්ට නොදෙව තොප
ගේ මුතු සූකරයෝ තමන්ගේ පයින් මැ
ඩපෙරලා තොප විදරනය නො
කරනපිනිස ඒවා ඔවුන්
ගේ අභිමුඛයෙහි
නොදමව්.

# ක්‍රිසතුසවහන්සේ නැවත යාඥා කල යාඥාවය.

## පූ වෙනි දෙලොසෙවනි පදවල්ය.

යාඥාකරව් එව්ට තොපට දෙනුලැබේ සොයව් එව්ට තොපට ලැබේ සන්කරව් එව්ට තොපට දෙරහරිනුලැබේ මක්නිසාද යාඥාකරනානාවූ සියල්ලෝ ලබනා සොයනා තැනාතෙක් ලබනොන්ය සන්කරනා තැනැත්තාහට දෙරහරිනුලැබේ ඉදින් තොප අතුරෙන් යම්කිසි මනුෂ්‍යයෙක් ස්වකීය පුත්‍රයා පුපයන් ඉල්ලූ කල ඕහට ගලක්දේද නොහොත් මත්ස්‍යයකු ඉල්ලූකල ඕහට සර්පයකුදේද නාපුරුවූ තොපි පවා තමන් දරුවන්ට යහපත්දේ දෙන්ට දනිව්නාම් ස්වර්ගයෙහි සිටිනා තොපගේ පියානන්වහන්සේ තමන්වහන්සේගෙන් යාඥා කාරනානාවූන්ට යහපත්දේ කොපමනා වැඩිතරම්ව නොදෙනසේක්ද එබැවින් මනුෂ්‍යයෝ තොපට කරනාවාට වඩා තොපි කැමැත්තාහ

ල්

නම් ඒ ඒ දේ ඔවුන්ට එසේම කරව් මක්නිසාද ආගමත් අනාගතවක්තෘවරුත් මෙය.

## නුපුළුල් දොරින් ප්‍රවිෂ්ට වෙනපිනිස ක්‍රිස්තුස්වහන්සේ දුන් දනුමැති කම ගැනය.

## ෂෙ වෙනි ෂෞ වෙනි පරිච්ඡේදය.

නුපුළුල් දොරින් ප්‍රවිෂ්ටවව් මක්නිසාද
විනාසයට ගෙනයන දොර පුළු
ලය මාර්ගයද විසාලය එයින්
ප්‍රවිෂ්ට වෙනෙනෝ බොහෝ
ඇත්තාහුය ජීවිතයට පමු
ණුවනදොර නුපුළුල්ය මාර්ගයද
නොවිසාලය එයට පැමි
ණෙනෙනෝ ස්වල්ප දෙ
නෙක් වෙති.
තමුන්ගේ ඵලවලින් හැඳිනෙන්ට පුළු

## වනවූ මිථ්‍යාඅනාගතවක්තෘන්ගෙන් ප්‍ර වේසම්වීම ගැනය.

### 15 වෙනි 20 වෙනිපදවල්ය.

මිථ්‍යාඅනාගත වක්තෘන්ගෙන් ප්‍රවේසම්
වෙයව් මක්නිසාද ඔවුන් එළුවන්ගේ සව
රූපයෙන් තොප සවම්පයට එනානාහුය
එහෙත් ඇතුලසයින් පිඩතාවූවෘකයෝයයි ඔවු
න්ගේ ඵලයෙන් තොපිදනානාහුය මනුෂ්‍යයෝ
කටුවලින් මුද්‍රිකද නොහොත් ගොකටුවලින්
දිඹුල්ද නෙලාගනිද්ද එසේම උතුම් වෘක්ෂසිය
ලූ උතුම් ඵලදෙනෙන්ය එහොත් අධම වෘක්ෂ
අධම ඵලදෙනෙන්ය උතුම් වෘක්ෂය අධම ඵල
ද අධම වෘක්ෂය උතුම් ඵලද දෙන්ට නොහැ
කිවනෙන්ය උතුම් ඵල නොදෙන සියළු වෘ
ක්ෂ සිඳිනලදුව ගිනෙනාහි දමනුලැබේ
එබැවින් ඔවුන්ගේ ඵලයෙන් තොපි ඔවුන්
දනානාහුය.

ඇදහිල්ලෙන් පමනාත් ක්‍රිස්තුස්වහන්
සේගේ සිස්සයින්නොව එහෙත්
ක්‍රියාවෙන්ද උන්වහන්සේගේ
සිස්සයින් විමගැනායඃ

සිඅ වෙනි සිඥ වෙනිපදවල්ය.

මාගේ පියානන්වහන්සේගේ කැමැත්ත කර නොනොත් හැර ස්වාමීන්වහන්ස ස්වාමීන්වහන් සැයි මට කියනනාවූ සකල්ල ස්වර්ගරාජ්‍යයට ඇතුල්නොවෙති ඒදිනයෙහි ස්වාමීන්වහන්ස ඔබවහන්සේගේ නාමයෙන් මතුවනකාරැන්නූ නොකීමුද ඔබවහන්සේගේ නාමයෙන් යක්ෂයන් බැහැරනොකෙලෙමුද ඔබවහන්සේගේ නාමයෙන් නොයෙක් ආස්චර්‍ය්‍යම්හත් ක්‍රියාවල් නොකලමෝදැයි නොයෙක්දෙනා මට කියති එවිට මම කිසිකලෙකත් තොප නොහැඳිනිමි නපුරු ක්‍රියාකරණ තෙපි මාකෙරෙන් පහවයව් කියා ඔවූන්ට කියමි.

එවචනය අසා ඒක පිළිපදිනාවුන්
පර්වතයක් පිටගෙයක් ඉදිකල
අයකුට උපමාකර තාවද ඒ
අසා ඒක පිළිනොපදිනා වුන්
වැලි මතෙහි ගෙයක් ඉදි
කල වුන්ට උපමාකර
ක්‍රිසතුසවහන්සේ වදාළ කාරණව
ගැනයි.

## සීඥු වෙනි සිවුවෙනිපදවල්ය.

එහෙයින් යම්කිසිවෙක් මාගේ මේවචන අසා ඒවා පිලිපදිද ඒපුෂ්තෙම පර්වතයක් පිට ගේ සදාගත් නුවනැති මනුෂ්‍යයකුට උපමා කොරෙම් වර්ෂාවවැස ජලප්‍රවාහය අවුත් මාරුතා යද හමා ඒගෙට ගැසූනුමුත් පර්වතය පිට පි හිටූ බැවින් නොවැටුණේය මාගේ මිවචන අසා ඒවා පිලිනොපදිනා සියල්ලම වැලි මත් තෙහි ගෙයක්කොට ගත්නුවනැති මනුෂ්‍ය යකුට උපමාකරනු ලැබේ වර්ෂාව වැස ජල

ප්‍රවාහය අවුත් මාරුතයද හමා ඒගෙට ගසා ඒක වැටුනේය ඒගේ වැටීමද මහත්වූයේය.

ක්‍රිස්තුස්වහන්සේ තමන් දෙසනාවකර නිම කලකල්හි මනුෂ්‍යයෝ ඊට විස්මපත්වූවාවූ කාරනාව ගැනය.

සීඥ වෙනි සීණ වෙනි පදවල්ය.

යේසුස්වහන්සේ මේවචන කියා නිමවූකල්හි උන්වහන්සේගේ ඉගැන්වීමට මහජනයෝ විස්ම පත්වූවාහුය මක්නිසාද උන්වහන්සේ ආධ්‍යායකා කෙනෙක්මෙන් නොව ආඥාභාව සම්පන්න කෙනෙක්මෙන් ඉගැන්නූසේක.